දිනය: 2026 සැප්තැම්බර් මස 30 වන දිය

චක්‍රලේඛ අංක: 82/2026

ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
සියළුම දිසා කොමසාරිස්වරුන්
සියළුම සහකාර දිසා කොමසාරිස්වරුන්
සියළුම සමූහ බාලදක්ෂ නායක නායිකාවන් සහ
අධිකාරිපත්‍රලාභී සිඟිති බාලදක්ෂ/පෝතක බාලදක්ෂ /බාලදක්ෂ /මානවක බාලදක්ෂ නායක නායිකාවන්
බාලදක්ෂ දිසා ශාඛා ලේකම්වරුන් සහ විධායක සභා සාමාජිකයින් වෙත,

**ජාතික බාලදක්ෂ වැඩිහිටි සම්මාන - 2025/2026 සඳහා නාමයෝජනා කැඳවීම.**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ 2025/2026 වර්ෂ සඳහා වන ජාතික බාලදක්ෂ වැඩිහිටි සම්මාන (National Scout Adult Awards) සඳහා නාමයෝජනා සහ නිර්දේශ මෙයින් කැඳවනු ලැබේ.

මෙම සම්මාන මගින් ශ්‍රී ලංකාව පුරා බාලදක්ෂ ව්‍යාපාරයේ අභිවෘද්ධිය උදෙසා කැපවීමෙන්, ආදර්ශමත් නායකත්වයෙන් සහ දීර්ඝකාලීන ස්වේච්ඡා සේවයෙන් දායක වූ අධිකාරිපත්‍රලාභී සහ සේවා භාරකිරීමේ ලිපි හිමි නායක නායිකාවන්, කොමසාරිස්වරුන්/කොමසාරිස්වරියන් සහ ගිහි සාමාජිකයින් ඇගයීමට ලක් කෙරේ.

***සම්මාන වර්ගීකරණය***

1957 අංක 13 දරන ලංකා බාලදක්ෂ පනත සහ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ප්‍රතිපත්ති වලට අනුකූලව පහත සඳහන් කාණ්ඩ යටතේ නාමයෝජනා ඉදිරිපත් කළ හැකි වේ.

**1. ජාතික සම්මානය**

**රජත සිංහ ප්‍රදානය - The Silver Lion**

ප්‍රධාන කොමසාරිස්තුමාගේ සහ ප්‍රධාන බාලදක්ෂ අතිගරු ජනාධිපති තුමාගේ නිර්දේශය මත පිරිනමනු ලබන, අති විශේෂිත සේවය උදෙසා පිරිනමන ඉහළම ජාතික සම්මානය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ප්‍රධාන කොමසාරිස්තුමා විසින් පත් කරනු ලබන 07 දෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් මෙම තෝරා ගැනීම සිදුකර, අනතුරුව ප්‍රධාන කොමසාරිස්තුමා වෙත යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1.i | **රජත සිංහ ප්‍රදානය**<br>**The Silver Lion** | කොළ සහ කහපාට පීත්ත පටියක් සමග රජත සිංහ රුව සහිත ප්‍රදානයකි. මෙය ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් පිරිනමනු ලබන ඉහළම සම්මානය වේ. | 1. බාලදක්ෂ ව්‍යාපාරයේ උන්නතිය උදෙසා ජාත්‍යාන්තර මට්ටමේ සුවිශේෂී දායකත්වය දැක්වීම. ජාතික සහ දිසා මට්ටමින් නායකත්වය ගෙන ක්‍රියා කිරීම.<br>2. යහපත් සේවා කාලය.<br>3. ප්‍රධාන බාලදක්ෂ සහ ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්ගේ අභිමතාර්ථය මත ප්‍රදානය කරන්නකි. |



ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.
Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

## 2. නිර්භීතකම සඳහා ප්‍රදානයන්

සාමාන්‍යයෙන් තමාට අනතුරක් වීමට ඉඩ තිබියදී නොබියව ඉදිරිපත් වී යෙදුන නිර්භීත ක්‍රියාවකට දෙන ප්‍රදානයන්ය.

### 2 .i සුදුසුකම්

මෙම ප්‍රදානයන් ලැබීමට පෝතකයින්ට, බාලදක්ෂයින්ට, මානවක බාලදක්ෂයින්ට හෝ එම සාමාජිකයින්ගෙන් යුත් සමූහයකට පොදු වශයෙන් හා බාලදක්ෂ නායකයින්ට ද මෙම ප්‍රදානය දෙනු ලැබේ. ප්‍රදානයන් යෝජනා කරන කමිටුවේ සහ ප්‍රධාන කොමසාරිස්තුමා ගේ නිර්දේශය මත ප්‍රධාන බාලදක්ෂ විසින් ප්‍රදානය කරනු ඇත.

### 2 . ii නිර්භීතකම සඳහා ප්‍රදානයන් පිළිබඳ විස්තර

| | ප්‍රදානය | ප්‍රදානයේ ස්වභාව | සැපිරිය යුතු සුදුසුකම් |
|---|---|---|---|
| i | ලෝකඩ කුරුසිය<br>**The Bronze Cross** | රතු පීත්ත පටියක් සමග ලෝකඩ කුරුසියකි. මෙය බාලදක්ෂ සංගමය මගින් නිර්භීතකම සඳහා පිරිනැමෙන ඉහළම ප්‍රදානය වේ. | දැඩි අනතුරුදායක තත්වයකට මුහුණ පෑමට තිබියදීත් අසාමාන්‍ය අයුරින් ඉදිරිපත් වූ නිර්භීත ක්‍රියාවක් සඳහා මෙය ප්‍රදානය කරනු ලැබේ. |
| ii | රිදී කුරුසිය<br>**The Silver Cross** | නිල් පීත්ත පටියක් සමග රජත කුරුසියකි. | මෙය සැලකිය යුතු අනතුරුදායක අවස්ථාවකදී ඉටුකළ නිර්භීත ක්‍රියාවක් සඳහා ප්‍රදානය කෙරේ. |
| iii | රන් ආලේපිත කුරුසිය<br>**The Gilt Cross** | රතු සහ සිරස් ඉරි ඇති පීත්ත පටිය සමග රන් ආලේපිත කුරුසියකි. | මෙය අඩු බරපතලකමක් ඇති අනතුරුදායක අවස්ථාවකදී ඉටු කළ නිර්භීත ක්‍රියාවන් සඳහා ප්‍රදානය කෙරේ. |
| iv | ප්‍රසාද ප්‍රනාම<br>**A Bar** | ඉහත ප්‍රදානයන් සඳහා වර්ණ තීරුව සමග ප්‍රදානය කිරීම. | මේ වන විටත් ඉහත ප්‍රදානයන් දිනා ඇති අයෙකු නැවත එවැනි නිර්භීත ක්‍රියාවක් කිරීම වෙනුවෙන් ප්‍රදානය කෙරේ. |
| v | ප්‍රධාන බාලදක්ෂ ඇගයීම් ප්‍රශංසාව<br>**A Chief Scout's Commendation** | සුදු සහ නිල් පාට රෙදි වලින් සකස් කරන ලද පළඳනාවකි. | ඉහත අවස්ථාවකදී ඉහත ප්‍රදානයන් දිනා ඇති අයෙකු නැවත එවැනි නිර්භීත ක්‍රියාවක් කිරීම වෙනුවෙන් ප්‍රදානය කෙරේ. |

### 3. දීර්ඝ සේවා සහ විශිෂ්ඨ සේවා සම්මාන

(අධිකාරිපත්‍රලාභී සහ සේවා භාරකිරීමේ ලිපි හිමි නායක නායිකාවන් , කොමසාරිස්වරුන්/ කොමසාරිස්වරියන් සඳහා)

| | ප්‍රදානය | ප්‍රදානයේ ස්වභාවය | සැපිරිය යුතු සුදුසුකම් | අවම සේවා කාලය වසර |
|---|---|---|---|---|
| 3.i | **ප්‍රශංසා ලිපිය (Letter of Commendation)** | මෙම ප්‍රශංසා ලිපිය වසර 03 ක සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක/ නායිකාවන් සහ කොමසාරිස්වරුන්/ කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු/නායිකාවක වශයෙන් වසර 03 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. බාලදක්ෂ ප්‍රතිපත්ති අනුව බාලදක්ෂ දරුවන් වෙත අපේක්ෂිත උපරිම සේවාව ලබා දී තිබීම.<br>4. දිසා බාලදක්ෂ ක්‍රියාකාරකම් සඳහා සක්‍රියව සහභාගි වීම.<br>5. යහපත් සේවා කාලය. | 03 |
| 3.ii | **කුසලතා සහතිකය Certificate of Merit** | මෙම කුසලතා සහතිකය වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක/නායිකාවන් සහ කොමසාරිස්වරුන්/ කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු/නායිකාවක වශයෙන් වසර 05 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. ප්‍රශංසා ලිපිය (Letter of Commendation) ලබා තිබීම.<br>4. දිසා බාලදක්ෂ ක්‍රියාකාරකම් සඳහා සක්‍රියව සහාභාගි වී තිබීම.<br>5. බාලදක්ෂ ප්‍රතිපත්ති අනුව බාලදක්ෂ දරුවන් වෙත අපේක්ෂිත උපරිම සේවාව ලබා දී තිබීම.<br>6. යහපත් සේවා කාලය. | 05 |
| 3.iii | **සේවා පදක්කම Service Medal** | දම්පාට පීත්ත පටියක් සහිත මෙම සේවා පදක්කම වසර 10 ක අඛණ්ඩ විශේෂ සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක/නායිකාවන් සහ කොමසාරිස්වරුන් / කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු/නායිකාවක වශයෙන් වසර 10 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. කුසලතා සහතිකය (Certificate of Merit ) ලබා තිබීම.<br>4. දිසා ක්‍රියාකාරකම් මනාව සංවිධානය කිරීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කිරීම.<br>5. යහපත් සේවා කාලය. | 10 |

| | | | | |
|---|---|---|---|---|
| 3.iv | **විශිෂ්ඨ සේවා පදක්කම**<br>**Medal of Merit** | කොළ පාට පීත්ත පටියක් සහිත මෙම විශිෂ්ඨ සේවා පදක්කම වසර 15 ක අඛණ්ඩ සුවිශේෂී සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක නායිකාවන් සහ කොමසාරිස්වරුන්/ කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු /නායිකාවක වශයෙන් වසර 15 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. සේවා පදක්කම (Service Medal) ලබා තිබීම.<br>4. බාලදක්ෂ ව්‍යාපාරයේ උන්නතිය උදෙසා ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් වලදී පූර්ණ සහාය ලබා දී තිබීම.<br>5. යහපත් සේවා කාලය. | 15 |
| 3.v | **විශිෂ්ඨ සේවා පදක්කම සහ වර්ණ තීරුව**<br>**Bar To The Medal of Merit** | තැඹිලි පාට සිරස් පටියක් සහිත කොළ පාට පීත්ත පටියකින් යුත් මෙම විශිෂ්ඨ සේවා පදක්කම සහ වර්ණ තීරුව වසර 20 ක අඛණ්ඩ විශිෂ්ඨ සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක නායිකාවන් සහ කොමසාරිස්වරුන් / කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු /නායිකාවක වශයෙන් වසර 20 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. විශිෂ්ඨ සේවා පදක්කම (Medal Of Merit) ලබා තිබීම.<br>4. බාලදක්ෂ ව්‍යාපාරයේ උන්නතිය උදෙසා ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් වලදී පූර්ණ සහාය ලබා දී තිබීම.<br>5. දිස්ත්‍රික් ක්‍රියාකාරකම් සංවිධානය කර පැවැත්වීම.<br>6. යහපත් සේවා කාලය. | 20 |
| 3.vi | **රජත නෙළුම සම්මානය**<br>**The Silver Lotus** | තැඹිලි පාට පීත්ත පටියකින් ගෙල වට පලඳින මෙම රජත නෙළුම සම්මානය වසර 25 ක අඛණ්ඩ අතිවිශිෂ්ඨ සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක නායිකාවන් සහ කොමසාරිස්වරුන් / කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු /නායිකාවක වශයෙන් වසර 25 අඛණ්ඩ ක සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. විශිෂ්ඨ විශිෂ්ඨ සේවා පදක්කම සහ වර්ණ තීරුව (Bar To the Medal of Merit) ලබා තිබීම.<br>4. බාලදක්ෂ ව්‍යාපාරයේ උන්නතිය උදෙසා ජාතික මට්ටමින් ක්‍රියාකාරකම් සංවිධානය කර නායකත්වය ගෙන කටයුතු කර තිබීම.<br>5. යහපත් සේවා කාලය. | 25 |

| | | | | |
|---|---|---|---|---|
| 3.vii | **රජත නෙළුම සම්මානය සහ වර්ණ තීරුව Bar To The Silver Lotus** | කොළ පාට පටියක් සහිත තැඹිලි පාට පීත්ත පටියකින් ගෙලවට පලඳින මෙම රජත නෙළුම සම්මානය සහ වර්ණ තීරුව වසර 30 ක අඛණ්ඩ ප්‍රශස්ථ සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක නායිකාවන් සහ කොමසාරිස්වරුන් / කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු /නායිකාවක වශයෙන් වසර 30 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. රජත නෙළුම සම්මානය (The Silver Lotus) ලබා තිබීම.<br>4. බාලදක්ෂ ව්‍යාපාරයේ උන්නතිය උදෙසා විශිෂ්ඨ සේවයන් ඉටු කරමින් ජාතික මට්ටමින් නායකත්වය ගෙන ක්‍රියා කිරීම.<br>5. යහපත් සේවා කාලය. | 30 |
| 3.viii | **ස්වර්ණ නෙළුම සම්මානය (Golden Lotus)** | නිල් පාට පීත්ත පටියක් ගෙල වට පලඳින මෙම ස්වර්ණ නෙළුම ප්‍රදානය වසර 35 ක අඛණ්ඩ උත්කර්ශවත් සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක නායිකාවන් සහ කොමසාරිස්වරුන් / කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු /නායිකාවක වශයෙන් වසර 35 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. රජත නෙළුම සම්මානය සහ වර්ණ තීරුව (Bar To The Silver Lotus) ලබා තිබීම.<br>4. බාලදක්ෂ ව්‍යාපාරයේ උන්නතිය උදෙසා දිසා/ජාතික මට්ටමින් නායකත්වය ගෙන ක්‍රියාකර තිබීම.<br>5. යහපත් සේවා කාලය. | 35 |
| 3.ix | **ස්වර්ණ නෙළුම සම්මානය සහ වර්ණ තීරුව (Bar to the Golden Lotus)** | කොළ පාට තීරුවක් සහිත නිල් පාට පීත්ත පටියකින් ගෙලවටා පලඳින මෙම ස්වර්ණ නෙළුම සම්මානය වසර 40 ක අඛණ්ඩ අභිමානවත් සහ කීර්තිමත් සේවා කාලය සම්පූර්ණ කරන බාලදක්ෂ නායක නායිකාවන් සහ කොමසාරිස්වරුන් / කොමසාරිස්වරියන් සඳහා ප්‍රදානය කෙරේ. | 1. බාලදක්ෂ නායකයෙකු /නායිකාවක වශයෙන් වසර 40 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර තිබීම.<br>2. අධිකාරිපත්‍රලාභියෙකු වීම.<br>3. ස්වර්ණ නෙළුම සම්මානය (Golden Lotus) ලබා තිබීම.<br>4. බාලදක්ෂ ව්‍යාපාරයේ උන්නතිය උදෙසා දිසා/ජාතික මට්ටමින් නායකත්වය ගෙන ක්‍රියාකර තිබීම.<br>5. යහපත් සේවා කාලය. | 40 |

4. ඇගයීම් සම්මානය (ගිහි සාමාජිකයින් සහ ව්‍යාපාරයේ උන්නතිය සඳහා විශේෂ දායකත්වය ලබා දෙන සම්භාවනීය පද්ගලයන් සඳහා පිරිනැමෙන ප්‍රදානයන් පිළිබඳ විස්තර)

| | | | |
|---|---|---|---|
| 4.I | **ස්තුති පදක්කම**<br>**The Thanks Badge** | බාලදක්ෂ සලකුණ සහිත කුඩා පදක්කමකි. | දිසා හෝ ජාතික මට්ටමින් බාලදක්ෂ ව්‍යාපාරයට ලබාදුන් වටිනා සහයෝගය ඇගයීම පිණිස. |
| 4.II | **ස්තුති ප්‍රශංසා ලාංඡනය**<br>**The Thanks Medal** | ජාතික බාලදක්ෂ සලකුණ සහිත ගෙල පළඳනාවකි. | දිසා හෝ ජාතික මට්ටමින් බාලදක්ෂ ව්‍යාපාරයට ලබාදුන් විශේෂ සහයෝගය ඇගයීම පිණිස. |
| 4.III | **උසස් ඇගයීම් ප්‍රශංසා ලාංඡනය**<br>**Highest Appreciation Medal** | ලෝක බාලදක්ෂ සලකුණ සහිත ගෙල පළඳනාව. | දිසා හෝ ජාතික මට්ටමින් බාලදක්ෂ ව්‍යාපාරයට ලබාදුන් විශිෂ්ඨ දායකත්වය ඇගයීම පිණිස. |

5. ආයතන සඳහා

| | | |
|---|---|---|
| 5.i | **රිදී ප්‍රදානය (Silver)** | දිසා හෝ ජාතික මට්ටමින් බාලදක්ෂ ව්‍යාපාරයේ සමස්ථ සංවර්ධනය උදෙසා ප්‍රශස්ථ සේවාවක් ලබාදුන් සුවිශේෂ දායකත්වය ඇගයිම පිණිස. |
| 5.ii | **රන් ප්‍රදානය (Golden)** | දිසා හෝ ජාතික මට්ටමින් බාලදක්ෂ ව්‍යාපාරයේ සමස්ථ සංවර්ධනය උදෙසා විශිෂ්ඨ සේවාවක් ලබාදුන් සුවිශේෂ දායකත්වය ඇගයිම පිණිස. |
| 5.iii | **ප්ලැටිනම් (Platinum)** | දිසා හෝ ජාතික මට්ටමින් බාලදක්ෂ ව්‍යාපාරයේ සමස්ථ සංවර්ධනය උදෙසා අති විශිෂ්ඨ සේවාවක් ලබාදුන් සුවිශේෂ දායකත්වය ඇගයිම පිණිස. |

6. සාමාන්‍ය සුදුසුකම් සහ නිර්ණායක

- අයදුම්කරු අදාළ කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් නිකුත් කරන ලද වලංගු අධිකාරි පත්‍රයක් (Warrant), සේවා භාරකිරීමේ ලිපියක් ලබා සිටිය යුතු ය.
- අයදුම්කරු අයත් බාලදක්ෂ සමූහය හෝ දිසාව අදාළ වර්ෂය සඳහා වන වාර්ෂික බාලදක්ෂ සංගණන (Census) ගාස්තු ගෙවීම් සම්පූර්ණ කර තිබිය යුතු ය.
- 2026 සැප්තැම්බර් මස 30 දිනට සේවා කාලය ගණනය කරනු ලැබේ.
- අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර හානියෙන් සුරක්ෂාව (Safe from harm) පිලිවෙත් වලට අනුකූලව කටයුතු කර තිබිය යුතු ය.

7. i ජාතික මට්ටමේ ගිහි නිලධාරීන්, සාමාජිකයන් සහ සම්භාවනීය පුද්ගලයන් සඳහා සම්මාන නිර්දේශ කිරීම ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් විසින් සිදු කරනු ලබයි.

ii ගිහි නිලධාරීන්/සාමාජිකයන් සම්මාන සඳහා නිර්දේශ කිරීම දිසා කොමසාරිස් විසින් සිදුකර නියමිත පරිදි ලිපියක් මගින් අවසන් දිනට පෙර එවිය යුතු ය.

8. **නාමයෝජනා ක්‍රියා පටිපාටිය**

සටහන: දිසා මට්ටමේ නාම යෝජනා ජාතික මූලස්ථානය වෙත සෘජුව එවනු ලබන පුද්ගලික අයදුම් පත් භාරගනු නොලැබේ. දිසා අයදුම්පත් දිසා කොමසාරිස් මගින් යොමු කළ යුතුය.

මූලස්ථාන කොමසාරිස්වරුන්ගේ අයදුම්පත් සහය ප්‍රධාන කොමසාරිස් (කළමණාකරණ) මගින් යොමු කළ යුතු ය.

- අයදුම්පත: ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ නිල වෙබ් අඩවියෙන් (www/scout.lk) බාගත කරගත හැකි AR 05 (වැඩිහිටි සම්මාන නිර්දේශිත අයදුම්පත) නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.
- අමුණා එවිය යුතු ලේඛන:
  - යාවත්කාලීන කරන ලද අධිකාරි පත්‍රය සහ සේවා කාලය සනාථ කිරීම සඳහා වන ලිපි ලේඛන වල තමන් විසින් සත්‍ය බවට සහතික කරන ලද ඡායා පිටපතක්.
  - අවසාන වරට ලබා ගත් සම්මානයේ ඡායා පිටපතක්.

9. **අයදුම්පත් /නාමයෝජනා භාරදීමේ අවසාන දිනය සහ ලිපිනය**

සම්පූර්ණ කරන ලද සියලු ම නාමයෝජනා ලිපිගොනු සහ ඩිජිටල් සාරාංශ පත්‍රිකාව ([illegible] format) පහත දැක්වෙන දිනට හෝ ඊට පෙර ජාතික මූලස්ථානය වෙත ලැබීමට සැලැස්විය යුතු ය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම් කෙලවරේ **"ජාතික බාලදක්ෂ වැඩිහිටි සම්මාන 2025/2026"** යනුවෙන් සටහන් කර එවිය යුතු ය.

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : 2026 ඔක්තෝම්බර් මස 15 වන දින.
- තැපල් ලිපිනය: ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්,<br>ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය,<br>අංක 65/09, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,<br>කොළඹ 02.
- විද්‍යුත් තැපෑල (Soft Copies): adultresources@scout.lk

ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් සලකා බැලීමකින් තොරව අදාළ දිසා ශාඛාව වෙත ආපසු හරවා යවනු ලැබේ.

මෙයට,
බාලදක්ෂ සේවයේ,

**නීතිඥ කපිල කල්‍යාණ පෙරේරා**
නියෝජ්‍ය ප්‍රධාන කොමසාරිස්

**නීතිඥ මනෝජ් නානායක්කාර**
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

පිටපත් :
සභාපති, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, විධායක කමිටු සභාපති
සියලුම විධායක කාරක සභා සාමාජිකයින්
කාර්යාල ලිපිගොනුවට